PR/2019/S 25

# ජපන් තානාපති කාර්යාලය

නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629

ඊ-මේල: cultujpn@sltnet.lk

සැප්තැම්බර් 18, 2019

## පුවත්පත් නිවේදනය

**ජපානයෙන් ශ්‍රී ලංකාවේ කාන්තාවන්, සාමය හා ආරක්ෂාව පිළිබඳවූ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 2 ක්**

ජපන් රජය මගින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්, සාමය හා ආරක්ෂාව පිළිබඳ වූ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට ජපන් යෙන් මිලියන 218 ක් (දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 2 ක්) එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN Women) හරහා ලබාදීමට තීරණය කර ඇත.

මෙම ව්‍යාපාතියට අදාල හුවමාරු පත්‍ර සඳහා අත්සන් තැබීම, 2019 සැප්තැම්බර් 18 වන දින ජපන් තානාපති අකිරා සුගියම මහතා සහ එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකයේ ආසියානු පැසිෆික් කළාපීය අධ්‍යක්ෂ මොහොමඩ් නසීරි මහතා විසින් කොළඹ පිහිටි ජපන් තානාපති නිල නිවසේදී සිදුකරණ ලදී. මෙම අවස්ථාවට කාන්තා හා ළමා කටයුතු සහ වියළි කළාප සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් දර්ශනා සේනානායක මහත්මිය ද සහභාගී විය.

මෙම මුදල් ප්‍රදානය, ශ්‍රී ලංකා රජය විසින් කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට හා ඒ යටතේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වලට මූලිකත්වය දීමටත්, මානව හිමිකම් පිළිබඳව ඔවුන්ව දැණුවත් කිරීමටත්, කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමටත් යොදවනු ඇති.

මෙම ආධාරය, අප්‍රේල් මස G7 විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී එකග වූ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව (WPS) පිළිබඳ වූ හවුල් වැඩසටහන යටතේ ජපානය විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන සහයෝගයකි. මෙම වැඩසටහන යටතේ WPS න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයෑම සඳහා ශ්‍රී ලංකාවේ හවුල්කරු ලෙස ජපානය පත්කර ඇත. මේ අනුව තවදුරටත්, ජපානය අනෙකුත් G7 සාමාජික රටවල් සමග ශ්‍රී ලංකාවට සහයෝගය දැක්වීමට බලාපොරොත්තු වෙයි. (නිමි)

*****************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය 011-269-3831~3 (දිගු අංකය 226)